# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1719/6 - 2011 අගෝස්තු 16 වැනි අඟහරුවාදා - 2011.08.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1954 අංක 37 දරන ජාතික නිවාස පනත**

25(2) වගන්තිය යටතේ නිකුත් කළ නියෝගය අවලංගු කිරීම

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යවරයා ලෙස ක්‍රියාකරන විමල් වීරවංශ වන මම 1954 අංක 37 දරන ජාතික නිවාස පනත සහ එයට පසුව ඇති කළ සංශෝධන යටතේ එහි 25(2) වගන්තිය මගින් මා වෙත ලබා දී ඇති බලතල ප්‍රකාරව 2011 ජනවාරි 28 වැනි දින ප්‍රකාශයට පත් කළ ගැසට් පත්‍රයෙහි 1 වැනි කොටසෙහි 1 වැනි ඡේදය යටතේ නේෂන්ස් බිල්ඩින් සොසයිටි (මෙයට පෙර සෙලින්කෝ බිල්ඩින් සොසයිටි ලිමිටඩ් යනුවෙන් හඳුන්වන ලදී) යන ගොඩනැගිලි සමිතියට සමාගම් පනතේ XII වැනි සහ XIII යන කොටස් වල දක්වා ඇති විධිවිධාන අදාළ වන බවට නිකුත් කළ නියෝගය 2011.08.03 වන දින සිට ඉවත් කර, අහෝසි කර අවලංගු කරමි.

විමල් වීරවංශ,  
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා,  
නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය.

2011 අගෝස්තු මස 03 වැනි දින,  
2 වැනි මහල,  
"සෙත්සිරිපාය",  
බත්තරමුල්ල,  
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

09-25


1A - G 14928—335 (2011/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.